# සිංහල නැණ පියස



උසස් පෙළ විභාග අත්වැල


# පුරාතන පද්‍ය සාහිත්‍යය





මෙහෙයවීම:-

ඩී.එස්.එම්.කුසුම්
ජාතික ශික්ෂණවිද්‍යා ඩිප්ලෝමාව (සිංහල)
ශාස්ත්‍රවේදී උපාධි
අ.පො.ස(උසස් පෙළ/සාමාන්‍ය පෙළ) පිළිතුරු පත්‍ර නිරීක්ෂක
අ.පො.ස(උසස් පෙළ) ආචාර්ය
ර/නිවි/රාජකීය විද්‍යාලය

# පුරාතන පද්‍ය


බුදුගුණාලංකාරය


වෑත්තෑවේ හිමියන් විසින් රචිත
ගුත්තිල කාව්‍ය


ලෝකෝපකාරය



තොටගමුවේ ශ්‍රී රාහුල හිමි විසින් රචිත
සැලළිහිණි
සංදේශය


# පුරාතන පද්‍ය සාහිත්‍යයේ විවිධ අවධි හඳුනා ගැනීම


- අනුරාධපුර
- පොළොන්නරු
- දඹදෙණි
- ගම්පොළ
- කුරුණෑගල
- කෝට්ටේ
- සීතාවක
- මහනුවර

# විවිධ අවධිවලට අයත් පුරාතන සිංහල පද්‍ය සාහිත්‍ය කෘති

| | | |
|---|---|---|
| • අනුරාධපුර අවධිය : | * සීගිරි ගී | |
| | * සියබස්ලකර | - සලමෙවන් රජතුමා (1 සේන රජු) |
| • පොළොන්නරු අවධිය : | * මුවදෙව්දාවත | - කර්තෘ අඥාත යි |
| | * සසදාවත | - කර්තෘ අඥාත යි |
| • දඹදෙණි අවධිය : | * කව්සිළුමිණ | - කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත දෙවන පැරකුම්බා නිරිඳු |
| | * එළු සඳැස් ලකුණ | - හදු නම් තෙර නමක් |
| | ලකුණුසර | - කර්තෘ අඥාත යි |
| • ගම්පොළ අවධිය : | * මයූර සන්දේශය | - කවිශ්වර නම් කිවිදෙක් |
| | * තිසර සන්දේශය | - කර්තෘ අඥාත යි |







| | | | | |
|---|---|---|---|---|
| • කුරුණෑගල් අවධිය | : | * | සඳකිඳුරු දා කව | - විල්ගම්මුල මාහිමි (ඇතැම් වියත්හු මෙය මහනුවර යුගයට අයත් කාව්‍ය කෘතියක් බවට මත පළ කරති.) |
| • කෝට්ටේ අවධිය | : | | පරෙවි සන්දේශය | - තොටගමුවේ ශ්‍රී රාහුල මාහිමි |
| | | * | සැලළිහිණි සන්දේශය | - තොටගමුවේ ශ්‍රී රාහුල මාහිමි |
| | | * | කාව්‍යශේඛරය | - තොටගමුවේ ශ්‍රී රාහුල මාහිමි |
| | | | ලෝවැඩ සඟරාව | - වීදාගම මෛත්‍රේය නාහිමි |
| | | * | බුදුගුණ අලංකාරය | - වීදාගම මෛත්‍රේය නාහිමි |
| | | | දහම් ගැටමාලාව | - වීදාගම මෛත්‍රේය නාහිමි |
| | | | හංස සන්දේශය | - වීදාගම මෛත්‍රේය නාහිමි |
| | | | කෝකිල සන්දේශය | - දෙවිනුවර තිලක පිරුවන්පති |
| | | | ගිරා සන්දේශය | - කර්තෘ අඥාත යි |
| | | | පැරකුම්බා සිරිත | - කර්තෘ අඥාත යි |
| | | * | ගුත්තිල කාව්‍යය | - වෑත්තෑවේ හිමි |
| • සීතාවක අවධිය | : | * | සුභාෂිතය | - අලගියවන්න මුකවෙටි |
| | | | සැවුල් සන්දේශය | - අලගියවන්න මුකවෙටි |
| | | | කුස්තන්තීනු හටන | - අලගියවන්න මුකවෙටි |
| | | | දහම්සොඬ දා කව | - අලගියවන්න මුකවෙටි |
| | | * | කුස ජාතක කාව්‍ය | - අලගියවන්න මුකවෙටි |
| • මහනුවර අවධිය | : | | සෙංකඩගල විස්තරය | - කර්තෘ අඥාත යි. |
| | | * | වෙස්සන්තර කාව්‍යය | - කර්තෘ අඥාත යි. |
| | | * | වියොවගරත්නමාලය | - පත්තායමේ ලේකම් |
| | | | කව්මිණි මල්දම | - කටුවානේ දිසානායක |


සැ. යු.

- ඇතැම්හු සීතාවක අවධිය කෝට්ටේ අවධියේ ම අපර (පසු) කොටසක් ලෙස සලකති.
- ''මාතර කවිය'' යනුවෙන් විශේෂ කාව්‍ය සම්ප්‍රදායක් ඇති නමුත් එය අවධියක් වශයෙන් නො පිළිගැනේ. එය මහනුවර අවධියේ ම අපර කොටස ලෙස සැලකේ.









# පුරාතන පද්‍ය සාහිත්‍යයේ ලක්ෂණ හඳුනා ගැනීම:-

## 1. සන්දර්භීය ලක්ෂණ

- මහා කාව්‍ය
- ඛණ්ඩ කාව්‍ය
- කෝෂ කාව්‍ය
- චම්පූ කාව්‍ය

## 2 .විරිත්

- ගී
- සිවුපද
- සිලෝ

## 3. අන්තර්ගතය

- ජාතක කතා ඇතුළත් කාව්‍ය (සසදාවත, මුවදෙව්දාවත)
- බුදුගුණ ඇතුළත් කාව්‍ය (බුදුගුණ අලංකාරය)
- සන්දේශ කාව්‍ය (පරෙවි ,හංස, ගිරා)
- ප්‍රශස්ති කාව්‍ය (පැරකුම්බා සිරිත)
- උපදේශ කාව්‍ය (ලෝවැඩ සඟරාව, සුභාෂිතය )

## 4 . පුරාතන පද්‍ය කෘති රචනා කිරීමේ අරමුණු

- බුදු සිරිත වර්ණනාත්මක ව නිරූපණය කිරීම.
- චතුර් වර්ග ඵල සම්පත්තිය ළඟා කරගැනීම.
- ශ්‍රද්ධාව වර්ධනය කර ගැනීම.

## 5 . වර්ණනා මාර්ගය


සියබස්ලකරින් අනුදත් අලංකාරවාදී වර්ණනා මාර්ගය සහ ජන කාව්‍ය සම්ප්‍රදාය (පෙදෙන් බුදු සිරිතැ බසින් වත් සිරිත් ඈ)


## 6. භාෂාව

- සිදත් සඟරා වර්ණ මාලාවේ ඇතුළත් අක්ෂර උපයෝගී කරගත් අමිශ්‍ර සිංහල ව්‍යවහාරය
- පසු කාලීනව පාලි සංස්කෘත වචන මිශ්‍ර ව්‍යවහාරය උපයෝගී කරගෙන ඇත.

# පද්‍ය කාව්‍ය

- මහා කාව්‍ය
- ඛණ්ඩ කාව්‍ය
- කෝෂ කාව්‍ය
- චම්පු කාව්‍ය



## ❖ මහා කාව්‍ය ලක්ෂණ

- ❑ සංස්කෘත කාව්‍යාදර්ශයෙහි මෙන්ම සිංහල සියබස්ලකරෙහි සඳහන් අන්දමට සර්ග බන්ධනයෙන් යුක්ත වීම.

- ❑ ප්‍රණාම,ආශිර්වාද,වස්තු නිර්දේශ යන විධිත්‍රයයෙන් එකකින් කාව්‍යය ආරම්භ කිරීම.

- ❑ කථාවස්තුව ඓතිහාසික හෝ සජ්ජන  චරිතයක් වීම.

- ❑ කාව්‍ය නායකයා දක්ෂ ,උදාර ,ගුණයුක්ත පුද්ගලයෙකු වීම.

- ❑ ඒ ඒ සර්ග කුඩා නොවන සේ විස්තර සහිතව රස භාව අන්තර්ගත කොට බන්ධනය කළයුතු අතර සර්ග සංඛ්‍යාව ප්‍රමාණවත් වීම.
  (කව්සිළුමිණ -767,  කාව්‍යශේඛරය-887  )

- ❑ කවීහුගේ වර්ණනීය විෂයෙහි නාමය නොහොත් කාව්‍ය නායකයාගේ නාමය ගෙන කාව්‍ය සංඥාව තැබීම.

## ඛණ්ඩ කාව්‍ය

- එක් විෂයක් ආශ්‍රයෙන් ලියවුණු පද්‍ය සමූහය යි.සර්ග බන්ධනයක් නැතිව එක ම අරමුණක පිහිටා මහා කාව්‍ය ලක්ෂණයන්ගෙන් කිහිපයක් ඇතුළත්ව රචනා කිරීම.
  (ගුත්තිල කාව්‍යය - කවි 511, මුවදෙව්දාවත - ගී 164)

## කෝෂ කාව්‍ය

- එකිනෙක සම්බන්ධයක් නැති සජාතීය කරුණු සංග්‍රහ කිරීම් වශයෙන් බන්ධනය කළ ශ්ලෝක සමූහය යි.
  (පුරාණ නාමාවලිය- සිව්පද විරිත,නම්රුවන්මල- ගී විරිත)

## චම්පූ කාව්‍ය

- ගද්‍ය පද්‍ය මිශ්‍රණයෙන් ලියවුණු ශ්‍රව්‍ය කාව්‍ය විශේෂයකි.

## ගුත්තිල කාව්‍යයේ පසුබිම

- කෝට්ටේ රාජධානි සමය සහ වෙළෙඳ ආර්ථිකයේ වර්ධනය

## කතුවරයා

- වෑත්තෑවේ හිමි

# නිර්දිෂ්ට කොටසේ විරිත් භාවිතය

## මහ පියුම් විරිත (ගී විරිත)

**91-115/ 130-224/  224-289/ 314-317**

| | | |
|---|---|---|
| ගුත්තිල ඇදුරු | සඳ | (මාත්‍රා 9) |
| U - - - - - - | - - | |
| වීණා වයන ලෙස | ඉඳ | (මාත්‍රා 11) |
| UU - - - - - | - - | |
| පසෙක පනවන | ලද | (මාත්‍රා 9) |
| - - - - - - - | - - | |
| සුදුසු අස්නෙක ගොසින් උන් | සඳ | (මාත්‍රා 14) |
| - - - U - - - U U | - - | |

# පෙද විරිත

**225-243/ 290-308**

දිය දිය ගොස පළ කෙරෙමින් සපැමිණි (16)
ගිය ගිය තැන ඉස්වා රන් මුතුමිණි (16)
ගිය ගිය දිය නද එන මෙන් ගෙනමිණි (16)
සිය සිය ගුණයෙන් වේණ නද නික්මිණි (16)

# වසන්ත විරිත

**116-129**

සදවා සුදු වැලි පිවිතුරු (මාත්‍රා 12)
- - U - - - - - - - -

බඳවා රන් දද පියකරු (මාත්‍රා 12)
- - U U -- - - - -

සිටුවා දොර දොර රඹ තුරු (මාත්‍රා 12)
- - U - - - - - - - -

තබවා පුන් කුඹු විසිතුරු (මාත්‍රා 12)
- - U U - - - - - -

# <u>සවිසිමත් විරිත</u>

මෙය නුපුන් සඳ විරිත නොවේ.309-313

